# කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් (අංක 6) අධිකරණයේදී ය.

සුදත්ත සිල්වා

රේගු අධිකාරී

**පැමිණිලිකරු**

නඩු අංකය : B/24872/ 06/ 2015

එම්. මොහොමඩ් සුබේර් ජාන් මොහොමඩ්

**සැකකරු**

2015 අප්‍රේල් 02 දින දීය.

මාර්තු මස 25 දින රේගුව වෙත ඉදිරිපත් වන ලද මෙම නඩුවේ සැකකරු රේගුව විසින් පසු දින, එනම් මාර්තු මස 26 දින B වාර්තාවක් මඟින් මෙම අධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර අධිකරණය විසින් සැකකරු අප්‍රේල් මස 08 දින දක්වා බන්ධනාගාර ගත කරන ලදි.

රේගු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය බවත්, සැකකරු බන්ධනාගාර ගත කිරීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 127 අ වගන්තිය ප්‍රකාර නිතිපති වරයාගේ උපදෙස් මත පනවන ලද රේගුලාසි උල්ලංඝනය කරමින් නීති විරෝධීව සිදු කර ඇති බවත්, සැකකරු වෙනුවෙන් ගරු අධිකරණය වෙත ඔහුගේ නීතිඥ වරයාවු මවිසින් කරුණු වාර්ථා කර ඇත.

මෙම සැකකරු බන්ධනාගාර ගත කිරීම ගරු අධිකරණය සම්පූර්ණයම නොමග යවා අධිකරණ බලය අයතා ලෙස කූට උපක්‍රමයකට එනම්, සැකකරු බන්ධනාගත කිරීමෙන් අනතුරුව ඔහුට අයථා බලපෑම් කිරීමෙන් විශාල දඩ මුදල් ගෙවීමට එකඟ කරවා ගැනිමට ගරු අධිකරණයේ අධිකරණ බලය නීති විරෝධී ක්‍රියාවට යොදා ගැනිමට රේගු නිළධාරීන් ක්‍රියා කරන බවට අදාල තොරතුරු මීට ප්‍රථමයෙන්, අධිකරණය නොමග යවන ලද බව , නිශ්චිත සාක්ෂි ඉදිරිපත් කරමින් ගරු අධිකරණය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් තහවුරු කර ඇත.

මේ අතර රේගු විසින් අධිකරණය වෙත **'වැඩි දුර ප්‍රකාශ සටහන් කර ගැනිම සඳහා'**කරන ලද ඉල්ලීමක් ප්‍රකාර මෙම නඩුවේ සැකකරු අප්‍රේල් මස 02 දින රේගුව වෙත ඉදිරිපත් කිරීමට ගරු අධිකරණය බන්ධනාගාර අධිකරණය වෙත නියෝග කර ඇත . එසේ රේගු විසින් කැඳවන ලද සැකකරුගෙන් අධික දඩ මුදලක් ගෙවීමට එකඟ බරවා ගැනීමෙන් අනතුරුව අප්‍රේල් මස 08 දින අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිත මෙම සැකකරු ඊට ප්‍රථම විමර්ශන කටයුතු අවසන් වී ඇති බවට ප්‍රකාශ කරමින් නිදහස් කර යැවීමට රේගුව ක්‍රියා කරන බව කරුණු අනාවරණය වී ඇත.

තවද මාර්තු මස 08 වන දින මෙම සැකකරු අත් අඩංගුවට ගැනීම හා බන්ධනාගාර ගත කිරීම නීති විරෝධීව සිදු කර ඇති බවට සලකා ප්‍රකාශයට පත්කිරීමට නියමිත අධිකරණ නියෝගය වැලැක්වීමට රේගු නිළධාරීන් කටයුතු කරන බවට කරුණු අනාවරණය වී ඇත.

තවද රේගු නිළධාරීන් අධිකරනය සම්පූර්ණ නොමග යවමින් සැකකරුවන් බන්ධනාගාර ගත කිරීමෙන් අනතුරුව විශාල දඩ මුදල් අය කර ගැනීමටත් ත්‍යාග මුදල් වශයෙන් ලබා ගැනීමටත් නීතිය අයතා ලෙස යොදා ගැනීමට අදාල නිළධාරීන් ක්‍රියා කර ඇති බව ගරු අධිකරනය වෙත ද එමෙන්ම මෙම බරපතල වංචාවට අධිකරණය යොදා ගැනීම සම්බන්ධයෙන් අල්ලස් හා දූෂන විමර්ශන කොමිසමට වාර්ථා කර ඇත. (මාර්තු මස 23 වන දින ඉදිරිපත් කරන ලද එම පැමිණිල්ලේ පිටපතක් මේ සමඟ X1 වශයෙන් ලකුණු කර මේ සමඟ ඉදිරිපත් කෙරේ).

තවද සැකකරුගේ නීතිඥවරයා රේගු නිළධාරීන්ගේ දූෂිත ක්‍රියාකාලාපය අණාවරණය කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් බලවත් සේ උරණ වී ඇති රේගු නිළධාරීන් මෙම නඩුවේ සැකකරුගෙන් ඔහුගේ නීතිඥවරයාට එරෙහිව සාවද්‍ය සාක්ෂි ලබා ගැනීමට ක්‍රියා කර ඇති බවට ද කරුනු ආණාවරනය වේ.

තවද සැකකරුගේ නීතිඥවරයා වු මා තව දුරටත් මෙම සැකකරු වෙනුවෙන් පෙනි සිටියහොත් සැකකරු දිගින් දිගටම බන්ධනාගත කිරීමට කටයුතු කරන බවට රේගු නිළධාරීන් විසින් සැකකරු වෙත කරන ලද අනිසි බලපෑම් ප්‍රකාර මෙම සැකකරු වෙනුවෙන් තව දුරටත් පෙනි නොසිටීමට මෙම සැකකරුගේ පාර්ශවය විසින් දැනටමත් මා වෙත ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම ප්‍රකාර තව දුරටත් සැකකරු නියෝජනය නොකිරීමට මා තිරණය කර ඇත.

කරුනු මෙසේ හෙයින් ආල නඩු දිනට ප්‍රථම එනම් අප්‍රේල් මස 08 වන දිනට ප්‍රථම මෙම සැකකරු නිදහස් කර හැරීමට රේගුව විසින් ගරු අධිකරණය වෙත ඉල්ලීමක් සිදු කල හොත්, සැකකරු බන්ධනාගත කිරීමේ නීත්‍යානුකූල බාවය හා රේගු නිළධාරී ක්‍රියාකාලාපය සම්බන්ධව අප්‍රේල් මස 08 වන දින ප්‍රකාශයට පත් කිරීමට නියමිත නියෝගයට යටත්ව සැකකරු නිදහස් කිරීමට කටයුතු කරන මෙන් ගරු අධිකරණයෙන් මෙයින් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

සැකකරුගේ නීතිඥ

නාගානන්ද කොඩිතුවක්කු

.....................................

N. Kodituwakku
Attorney-at-Law & Solicitor